

# <u>කොරියානු භාෂා විශේෂ පරීක්ෂණය සඳහා ලියාපදිංචි කිරීම -2026</u>

## <u>අයදුම්කරුවන් සඳහා උපදෙස්</u>

**විභාග අයදුම්පතක් ලබාගැනීමට නම් ඔබ සම්පූර්ණ කර තිබිය යුතු සුදුසුකම්**

1. වයස් සීමාව අවුරුදු 18 සහ 39 අතර ( 1986.04.28 සිට 2008.04.27 දක්වා )

2. අයදුම්කරුවන් සිරගතවීමක් හෝ බරපතල දඬුවමකට ලක්වී නොසිටීම.

3. අයදුම්කරුවන් සඳහා කොරියානු ජනරජයෙන් පිටුවහල් කිරීමේ හෝ පිටත්වීමේ නියෝග වාර්තාවක් නොතිබිය යුතුය. කොරියාවේ නීති විරෝධී ලෙස එක් දිනක් හෝ රැඳී නොසිටීම.

4. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවෙන් පිටත්වීමේ තහනමකට ලක්නොකොට තිබීම.

5. E-9 වීසා කාණ්ඩය සහ E-10 වීසා කාණ්ඩය යන වීසා කාණ්ඩ දෙක යටතේම වූ සේවා කාලයද ඇතුළුව වසර 05කට වඩා සේවා කාලයක් දකුණු කොරියාවේ සේවය කර නොමැති තැනැත්තන් විය යුතුය.

6. කොරියානු රාජ්‍යයේ විදේශගත ශ්‍රමිකයින් සඳහා වන පනතෙහි වගන්ති අංක 18-2 අනුව යම් ශ්‍රමිකයෙකුගේ සේවා කාලය දීර්ඝ කරන ලද අවස්ථාවකදී ඔවුන්ගේ සේවා කාලය වසර 06 ක් වුවහොත් මෙම විභාගය සඳහා ඔවුන් සුදුසුකම් ලබයි.

7. වර්ණ අන්ධතාවය,වර්ණ දුර්වලතාවය ඇති අයදුම්කරුවන් හට පරීක්ෂණය සමත්වීමට අවසර නොලැබේ.

8. කොඳු ඇට පෙළේ ආබාධයක් හෝ ඇඟිලි ආබාධ ඇති අයට EPS-TOPIK විභාගයට පෙනී සිටීමට අවස්ථාව නොමැත .

## <u>විභාග අයදුම්පතක් ලබාගැනීමට අවශ්‍ය දෑ</u>

**විභාග අයදුම්පත් ගාස්තුව ගෙවීම් කිරීම සඳහා උපදෙස්-**

1. **විභාග අයදුම්පත් ගාස්තුව- ඇමරිකානු ඩොලර් 28 ට සමාන රුපියල් අගය (රු. 8716.40 /- )**

   මෙම අයදුම්පත් ගාස්තුව ගෙවීම් කිරීමේදී ඔබට ආසන්නතම ජාතික ඉතිරිකිරීමේ බැංකුව,ලංකා බැංකුව හා මහජන බැංකුවෙහි පහත සඳහන් ගිණුම් අංකය වෙත බැර කිරීම සිදු කළ යුතුය.

   - 100-800-44-2461 - ජාතික ඉතිරි කිරීමේ බැංකුව (බත්තරමුල්ල ශාඛාව)
   - 0000001650 - ලංකා බැංකුව ( ආයතනික ශාඛාව)
   - 20810015179-1068 - මහජන බැංකුව (බත්තරමුල්ල ශාඛාව)

විභාග අයදුම්පත් ගාස්තු ගෙවීම් කලහැකි දිනය- 2026.04.27 සිට 2026.04.29

- **Online/ATM භාවිතයෙන් ගෙවීම් සිදු කිරීම් සිදු කළ නොහැක.**

- **බැංකු රිසිට්පත සම්පූර්ණ කිරිමේදී,**

  - ඔබගේ නම
  - ලිපිනය
  - ගමන් බලපත්‍ර අංකය
  - ජාතික හැදුනුම්පත් අංකය
  - ඔබගේ අත්සන පැහැදිලිව තිබීම අනිවාර්යය වේ.
  - දුරකථන අංකය පැහැදිලිව සටහන් කල යුතු අතර එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප වනු ඇත.

- **මුදල් ගෙවූ රිසිට්පත් පැහැදිලිව ස්කෑන් කර** File Size: 1MB) උඩුගත **(Upload) කළ යුතුය.**

## විදේශ ගමන් බලපත්‍රය උඩුගත කිරිම සදහා උපදෙස්-

- **ඉදිරියට මාස** 06 **ක කාලයක් සදහා වලංගු විදේශ ගමන් බලපත්‍රයේ ඔබගේ ඡායාරූපය සහිත පිටුවෙහි ස්කෑන් කරන ලද JPG ඡායාරූපයක් (1MB) විය යුතුය.**


**පහත සදහන් ආකෘතිය අනුව ඔබගේ ගමන් බලපත්‍රයේ පිටපත ස්කෑන් කල යුතුය. එසේම Barcode එක කැපී නොයන පරිදි සම්පූර්ණ පිටුවෙහි පිටපතක් ස්කෑන් විය යුතුය. එසේ නොවන අවස්ථාවන්හිදී ඔබගේ විභාග අයදුම් කිරීම අනුමත නොවනු ඇත.**




## ඡායාරූපය උඩුගත කිරිම සදහා උපදෙස්-

- මාස 03ක් ඇතුළත ලබාගත් 3.5 cm * 4.5 cm ප්‍රමාණයේ **සුදු පැහැති** පසුබිම සහිත පැහැදිලි ස්කෑන් කරන ලද වර්ණ ඡායාරූපයක් JPG විය යුතුය. ( සුදු පැහැති ඇඳුමකින් සැරසී ඡායාරූපය ගැනීමෙන් වැළකී සිටිය යුතුය)

  - File Size: 1MB
  - ඔබගේ මුහුණ පැහැදිලිව පෙනීම අනිවාර්යය වන අතර,ඡායාරූපය සදහා බෝඩර්,අකුරු ආදිය ඇතුළත් නොකළ යුතුය.
  - ශරීරය ඍජුව තබා ඡායාරූපය ලබා ගත යුතුය.
  - ඇස් කණ්ණාඩි නොපැළඳ ඡායාරූපය ලබාගත යුතුය.




මෙහි සඳහන් ආකාරයේ ඡායාරූප පිළිගනු ලැබේ.



මෙවැනි ඡායාරූප අනුමත නොකරනු ඇත.



## <u>ජාතික හැඳුනුම්පත උඩුගත කිරිම සඳහා උපදෙස්-</u>

- **ඔබගේ ජාතික හැඳුනුම්පතෙහි ඉදිරිපස හා පසුපස ස්කෑන් කරන ලද JPG ඡායාරූපයක් (1MB) විය යුතුය.**




විභාග අයදුම්පත් නිකුත් කිරිම අන්තර්ජාලය ඔස්සේ -මාර්ගගතව(online) සිදු කරන බැවින් ලියාපදිංචි වීමට පෙර පහත සදහන් අවශ්‍යතාවයන් සම්පුර්ණ කර ඔබ සතුව තබා ගැනීමට කටයුතු සිදු කරන්න.

**වර්ණ අන්ධතාවය,වර්ණ දුර්වලතාවය ඇති අයඳුම්කරුවන් හට පරීක්ෂණය සමත්වීමට අවසර නොලැබේ. ඔබ විභාගය සඳහා ලියාපදිංචි වන අවස්ථාවේදී ඔබට වර්ණ අන්ධතාවය,වර්ණ දුර්වලතාවයක් නොමැති බවට වෛද්‍යවරයෙකුගෙන් තහවුරුවක් ලබාගත යුතුය.**

**තවද, ඔබ විභාගය සමත්වීමෙන් පසුව කොරියානු රැකියා වෙබ් අඩවියට ලියාපදිංචි වීමට පෙර සිදු කරනු ලබන වෛද්‍ය පරීක්ෂණයේදී නැවතත් වර්ණ අන්ධතාවය පරීක්ෂාවට ලක් කරනු ලබන අතර එම අවස්ථාවේදී ඔබට වර්ණ අන්ධතාවය ඇති බවට තහවුරු වුවහොත් ඔබගේ විභාග ප්‍රතිඵල අවලංගු වනු ලැබේ.**

ඔබට කොරියානු මානව සම්පත් සංවර්ධන ආයතනය විසින් පවත්වනු ලැබූ සහාය පුහුණු වැඩසටහන් වලට අදාළව පහත සඳහන් සහතික තිබේ නම් ඔබ විභාග ගාස්තු ගෙවීමට අවශය නොවේ.ඒ බව ඉහතින් **Admission free** ලෙස පෙන්වා ඇත්නම් ඔබ විභාග අයදුම්පත් ගාස්තු ගෙවිය යුතු නැත.


## අමතර ලකුණු ලබාදීම සහ විභාග අයදුම්පත් ගාස්තුවෙන් නිදහස් කිරීම

<table>
<tr><th colspan="6">අමතර ලකුණු</th><th>විභාග අයදුම්පත් ගාස්තුවෙන් නිදහස් කිරීම (ඔව්/නැත)</th></tr>
<tr><td rowspan="4"><u>(A)</u><br>කොරියාවේදී පවත්වනු ලබන ආපසු සියරට පැමිණෙන ශ්‍රමිකයින් සඳහා වන සහාය පුහුණු වැඩසටහන</td><td>වසර</td><td colspan="2">කොරියානු භාෂා ප්‍රවීණතා පරීක්ෂණය 3වන මට්ටමට අදාළ පාඨමාලාව(උපරිම ලකුණු 20)</td><td colspan="2">රැකියා සඳහා රැකියා කුසලතා පුහුණුව/ව්‍යාපාර ආරම්භය</td><td rowspan="4">අමතර ලකුණු හිමි වේ.<br>විභාග අයදුම්පත් ගාස්තු අයකරගනු නොලැබේ.</td></tr>
<tr><td rowspan="2">2016</td><td>සම්පූර්ණ කිරිම</td><td>කොරියානු භාෂා ප්‍රවීණතා පරීක්ෂණය 3වන මට්ටමට අදාළ පුහුණුව හෝ ඉන් ඉහළ ඇති අය</td><td colspan="2">සම්පූර්ණ කිරිම</td></tr>
<tr><td>-</td><td rowspan="2">ලකුණු 20</td><td colspan="2" rowspan="2">ලකුණු -5</td></tr>
<tr><td>2017 සිට</td><td>ලකුණු 5</td></tr>
<tr><td><u>(B)</u> සෘතුමය රැකියා සඳහා පිටත්ව යාම</td><td colspan="5">සෘතුමය රැකියා සඳහා පිටත්ව යාම (10 points)</td><td>අමතර ලකුණු හිමි වේ.විභාග අයදුම්පත් ගාස්තු ගෙවිය යුතුය.</td></tr>
<tr><td><u>(C)</u><br>U-turn company worker</td><td colspan="5">කොරියානු භාෂා ප්‍රවීණතා පරීක්ෂණය 3වන මට්ටමට අදාළ පාඨමාලාව(උපරිම ලකුණු 20)</td><td>අමතර ලකුණු හිමි වේ.විභාග අයදුම්පත් ගාස්තු ගෙවිය යුතුය.</td></tr>
</table>

※ කොරියාවේදී පවත්වනු ලබන ආපසු සියරට පැමිණෙන ශ්‍රමිකයින් සඳහා වන සහාය පුහුණු වැඩසටහන සම්පූර්ණ කර ඇති ඔබ,අදාළ සහතික මේ සමඟ ඇති ඇමුණුමට අනුව අදාල අයදුම්පත්‍රය සම්පූර්ණ කර ලියාපදිංචියේදී උඩුගත කළ යුතුය.

※ කොරියානු භාෂා ප්‍රවීණතා පරීක්ෂණයේ 3 වන මට්ටම හෝ ඉන් ඉහළ ඇති අය එම සහතිකය පමණක් නොව කොරියානු අධ්‍යාපන ක්‍රියාවලිය සම්බන්ධ සහතිකයද ඉදිරිපත් කිරිම අනිවාර්ය වේ.

# බැංකු රිසිට්පත් පිරවිය යුතු ආදර්ශ ආකෘතිය



**PEOPLE'S BANK** — Deposit Slip — Office Copy

Account Number: 2 0 8 1 0 0 1 5 1 7 9 1 0 6 8 — Date: 0 4 2 0 2 6

Name of Account Holder: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

Name: නම සඳහන් කරන්න.

Address: ලිපිනය — Tel. No.: දුරකථන අංකය.

NIC/PP/DL No.: ගමන් බලපත්‍ර අංකය.

Purpose: කොරියානු භාෂා විභාග ලියාපදිංචි 2026 - විභාග ලියාපදිංචි ගාස්තු

Cash Depositor's Signature: ගමන් බලපත්‍රයේ අංකය.

Total: 8716 40

Valid if Overprinted or Signed by an Officer — Do Not Write Anything Below This Line — Checked by

**BANK OF CEYLON** — Cash Deposit Slip — Date: 0 4 2 0 2 6

Account/Card Number: 0 0 0 0 0 0 1 6 5 0

Account/Card Holder's Name and Address: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, නො. 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල.

For cash deposits above Rs. 200,000 deposited by Person other than A/C Holder/Card Holder

Depositor's Name and Address: තැන්පත්කරුගේ නම සහ ලිපිනය සඳහන් කරන්න.

N.I.C/P.P/D.L.No.: ගමන් බලපත්‍ර අංකය

Telephone No: දුරකථන අංකය සඳහන් කරන්න.

Purpose of Deposit: කොරියානු භාෂා විභාග ලියාපදිංචි

Ref No. 2026 අයදුම්පත් ගාස්තු

Depositor's Signature: ගමන් බලපත්‍රයේ අත්සන

Total: 8716 40

Valid Computer Print or Authorised Signature — Validation checked — Signature

**NSB National Savings Bank** — Cash Deposit Slip — Date: 0 4 2 0 2 6

Name/s of the Account Holder/s/Card Holder/s: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය.

Account No. / Reference No.: 100 800 44 2461

Amount in Words: රු. අටදහස් හත්සිය දහසයයි ශත හතළිහයි.

Amount in Figures: Rs. 8716.40

Fill this section if the cash deposit is above LKR 200,000/- and deposited by a person other than the account holder/card holder

Name: නම සඳහන් කරන්න.

Address: ලිපිනය

NIC/P.P/D.L. No.: ගමන් බලපත්‍ර අංකය

Source of Funds or Purpose of the Deposit: කොරියානු භාෂා විභාග ලියාපදිංචි - විභාග අයදුම්පත් ගාස්තු

Tel. No: දුරකථන අංකය — REF No.

Total: 8716 40

Depositor's Signature: ගමන් බලපත්‍රයේ සඳහන් අත්සන

Teller